# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ
# කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 3
# සේවා ගණයට අයත්
# දුම්රිය එන්ජින් රියැදුරු සහායක තනතුර සඳහා වන
# බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ
# කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 3
# සේවා ගණයට අයත් දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුර සඳහා වන
# බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

## 01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා දුම්රිය
යොමු අංකය : ප.03/138/2013/බ.ප./රි.ස. දිනය : 2015.11.26

.

1.2 අමාත්‍යාංශය : ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
යොමු අංකය : MT/03/09/04/02 දිනය : 2015.12.07

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :
යොමු අංකය : DMS/1142/V-II දිනය : 2015.08.26

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/RECRU/03/1271 දිනය : 2016.01.26

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NPC/02/43/SR දිනය : 2016.01.13

1.6 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය:
යොමු අංකය:අමප/09/2010/358/093 දිනය: 2010.01.01

1.7 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය (සංශෝධනය) :
යොමු අංකය : PSC/EST/04-01-43/03/2016 දිනය: 2016.06.09
සංශෝධිත දිනය: 2016.09.29

## 02. පත් කිරීම් බලධරයා

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරි

## 03. <u>සේවා ගණය පිළිබඳ විස්තර</u>

3.1 සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3

3.2 ශ්‍රේණි :
111 ශ්‍රේණිය
11 ශ්‍රේණිය
1 ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

දුම්රිය ධාවනය කිරීමේ කාර්යයේදී දුම්රිය එන්ජින් රියදුරුගේ / දුම්රිය එන්ජින් රියදුරු(ෂන්ටින්) ගේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ මෙම බඳවා ගැනීමේ පරිපාටියේ 6.1 ඡේදයේ දක්වා ඇති සහ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන තාක්ෂණික/ශිල්පීය/මෙහෙයුම් කාර්යයන් ඉටු කරනු ලබන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම: ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යොෂ්‍යතාවය හා

කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැකිය.

## 04. තනතුරෙහි /තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

## 05. වැටුප්

**5.1** වැටුප් කේත අංකය : **MT- 1 – 2006 (ඒ)**

**5.2** වැටුප් පරිමාණය : **රු.14,425-10 X 145-11 X 170-6 X 240-14 X 320-23,665/-**

සටහන:
ඉහත වැටුප් පරිමාණය හා ඒ ඒ ශ්‍රේණි වලට අදාළ ආරම්භක වැටුප් පියවර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව සකස් විය යුතුය.

**5.3** ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු) |
|---|---|---|
| **111** | **1 පියවර** | **රු.14,425/-** |
| **11** | **12 පියවර** | **රු.16,045/-** |
| **1** | **23 පියවර** | **රු.17,985/-** |

## 06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

**6.1** අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| දුම්රිය එන්ජින් රියැදුරු සහායක | 111, 11, 1 | **540** | **01.**<br>**i.** දුම්රිය එන්ජිමට අදාළ ආයුධ පෙට්ටි පරීක්ෂා කර නියමිත වේලාවට භාර ගැනීම හා ඒවා ආපසු භාරදීම.<br>**ii.** දුම්රිය එන්ජිම පණ ගැන්වීමට ප්‍රථම දුම්රිය රියදුරුගේ අධීක්ෂණය යටතේ තෙල් හා වතුර මට්ටම්, ගිනි නිවන උපකරණ තිබේද ඩීසල් ටැංකි ඉබි යතුරු දමා තිබේදයන වග පරීක්ෂා කිරීම හා රියැදුරු දැනුවත් කිරීම. ඩීසල්,වතුර,තෙල්,වායු හෝ වැකුම් කාන්දු තිබේ නම් රියැදුරුට දැන්වීම. ගමන් වාරයට ප්‍රථම ඉදිරිපස වීදුරුව තුලින් පැහැදිලිව දර්ශනය වන පරිදි පවත්වා ගත යුතුය. එන්ජිම පණ ගැන්වූ පසුව ධාවන වාරය පිටත්වීමට ප්‍රථම වායු ටැංකි වල කරාම ඇර ජලය ඉවත් කිරීම.ගමන් වාරයට ප්‍රථම රියදුරු කුටිය පිරිසිදු කිරීම<br>**iii.** දුම්රිය රියදුරුගේ අධීක්ෂණය යටතේ දුම්රිය ගමන් ආරම්භ කිරීමට ප්‍රථම දුම්රිය එන්ජිමේ ආරක්ෂිත ක්‍රමවේද (ස්කොච් හා අත් තිරිංග) ඉවත් කිරීම හා ධාවනයට සුදුසු පරිදි ඉදිරිය හා පසුපස පැහැදිලිද, සංඥා ලැබුනේද යන වග පරීක්ෂා කර රියැදුරු දැනුවත් කිරීම<br>**iv.** විවෘත මාර්ගයේ ධාවනයේදී ඉදිරිපස පැහැදිලිතාවය , අංගනයේ හෝ ධාවනාගාර පරිශ්‍රයේ ධාවනයේදී දෙපස, පසුපස හා ඉදිරිපස තත්ත්වය සංඥා තත්ත්වය |

| | | | |
|---|---|---|---|
| | | | පිළිබඳව රියැදුරුට ඇසෙන සේ හඬ නගා කියවීම හා යන ස්ථානයට(ගමනාන්තය) ටැබ්ලට්, ටෝකන් ලබාගත් පසු රියදුරුට භාර දීම හා නියාමකවරුන් විසින් දුම්රිය ධාවනය සඳහා ලබා දෙනු ලබන සංඥා රියදුරුට දැන්වීම<br>v. දුම්රිය එන්ජින් මැදිරි වලින් ගැලවීමේදී සහ මැදිරි වලට සම්බන්ධ කිරීමේදී ආරක්ෂාව තහවුරු වන පරිදි එම කාර්යයන් ඉටු කිරීම.(ස්වයංක්‍රීය ඇදුම්/ස්කෲ ඇදුම්, විදුලි කේබල් වැකුම් නල(විදුලි වැද්දුම්කරු නොමැති ස්ථාන වලදී පමණක්), සම්පීඩන නල නිසියාකාරව සවි කිරීම)<br>vi. දුම්රිය අනතුරකදී අබලන් වීමකදී හෝ පීලි පැනීමකදී හෝ වෙනත් අසාමාන්‍යය සිදුවීමකදී ආරක්ෂක නීති අනුව දුම්රිය රියදුරුගේ උපදෙස් පරිදි කටයුතු කිරීම.<br>vii. දුම්රිය රියදුරුගේ අධීක්ෂණය යටතේ දුම්රිය එන්ජිම ධාවනයෙන් පසු ස්ථානගත කිරීමෙන් පසු අදාළ ආරක්ෂක පියවර අනුගමනය කිරීම හා රියැදුරු දැනුවත් කිරීම.<br>viii. දුම්රිය එන්ජින් රියදුරුගේ උපදෙස් පරිදි ධාවනයේදී එන්ජින් කාමරය වරින් වර පරීක්ෂා කර අසාමාන්‍ය තත්වයක් ඇතොත් රියැදුරු දැනුවත් කිරීම.<br>ix. සංඥා මාර්ග හෝ දුම්රිය අබලන් වීමකදී රියැදුරුගේ උපදෙස් අනුව දුම්රිය ස්ථානාධිපතිට, ගේට්ටුකරුවන්ට අවශ්‍ය දැනුම්දීම් කිරීම.<br>x. දුම්රිය ආරක්ෂක නීති සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව දුම්රිය ධාවනය වෙමින් පවත්නා අවස්ථාවේදී දුම්රිය රියදුරු අකර්මන්‍යතාවයකට පත්වූ විට හදිසි තිරිංග ක්‍රියාත්මක කර දුම්රිය නැවැත්වීමට කටයුතු කිරීම.(තිරිංග ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු කර යෝග්‍යතාවය පිළිබඳව සමත් වී ඇති විටදී)<br>xi. හදිසි අනතුරකදී හෝ අබලන්වීමකදී රියැදුරුගේ උපදෙස් පරිදි අවශ්‍ය කටයුතු කිරීම.<br>xii. සේවයෙන් මිදීමේදී අදාල පොත් වල අත්සන් තැබීම හා ඊළඟ සේවා වාරය කුමක්ද යන්න තහවුරු කර ගැනීම.<br><br>02. දුම්රිය සාමාන්‍යාධිකාරී , අදාළ උප දෙපාර්තමේන්තු ප්‍රධානී හෝ අංශ භාර නිලධාරී විසින් වරින් වර පවරනු ලබන ඉහත කාර්යයන්ට අමතර වෙනත් රාජකාරී |

**6.2** ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : **540**

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා **111, 11** හා **1**ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සළකනු ලැබේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 30% |

| | |
|---|---|
| සීමිත | 70% |
| කුසලතා | අදාළ නොවේ |

සටහන: සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගනු ලබන සංඛ්‍යාව පහත පරිදි එක් එක් කාණ්ඩයන්ගෙන් තෝරා බඳවා ගනු ලැබේ. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මගින් තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගත හැකිය.

| බඳවා ගනු ලබන සේවක කාණ්ඩය | ප්‍රතිශතය |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල) උප දෙපාර්තමේන්තුවට අයත් තාක්ෂණ ශිල්පි සහායක තනතුරක අවුරුදු 10ක සක්‍රිය සේවා කාලයක් සහිත තාක්ෂණ ශිල්පි සහායක සේවකයින්. | 85% |
| ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුවට අයත් තාක්ෂණ ශිල්පි සහායක තනතුරක අවුරුදු 10ක සක්‍රිය සේවා කාලයක් සහිත තාක්ෂණ ශිල්පි සහායක සේවකයින්. | 10% |
| ප්‍රධාන ඉංජිනේරු(සංඥා හා විදුලි සංදේශ) උප දෙපාර්තමේන්තුවට අයත් තාක්ෂණ ශිල්පි සහායක තනතුරක අවුරුදු 10ක සක්‍රිය සේවා කාලයක් සහිත තාක්ෂණ ශිල්පි සහායක සේවකයින්. | 5% |

**7.2** විවෘත බඳවා ගැනීම :

**7.2.1** බඳවා ගන්නා ශ්‍රේණිය : **111 ශ්‍රේණිය**

**7.2.2** සුදුසුකම් :

**7.2.2.1** අධ්‍යාපන සුදුසුකම් : (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) භාෂාව ,ගණිතය ,විද්‍යාව සහ තවත් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

**7.2.2.2** වෘත්තීය සුදුසුකම් : තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වසර 2 ½ක කාර්මික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම

**7.2.2.3** පළපුරුද්ද : අදාළ නොවේ.

**7.2.2.4** කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ii. උස අවම වශයෙන් අඩි 05 අඟල් 04ක් විය යුතුය.

iii. 66 , 66 ඇෂ්ථි පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

7.2.2.5 වෙනත් :
i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස:
7.2.3.1 අවම සීමාව: අවුරුදු 18ට නොඅඩු
7.2.3.2 උපරිම සීමාව: අවුරුදු 35ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත විභාගය - (ඇමුණුම-01)

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| කාර්මික දැනුම | 100 | 50% |

7.2.4.1.1 පවත්වන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල් වරයා හෝ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීමක් පමණක් සිදු කෙරේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු: බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - අදාල නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින්.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : 111 ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක(02)ක් සහිතව විෂයයන් හය(06)කින් සමත් වී තිබීම.

- සටහන : 2008.01.01 දිනට පෙර දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය සඳහා බඳවාගත් සේවකයින්ට ඉහත 7.3.2.1 හි අධ්‍යාපන සුදුසුකම් බලනොපානු ලබන අතර ඒ වන විට අනුමත වී තිබූ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් බලපානු ලැබේ.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.3.2.3 පළපුරුද්ද :

තාක්ෂණ ශිල්පී සහායක තනතුරක අවුරුදු 10ක සක්‍රිය සේවා කාලයක් තිබීම.

7.3.2.4 කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
ii. උස අවම වශයෙන් අඩි 05 අඟල් 04ක් විය යුතුය.
iii. 6́6́ , 6́6́ ඇෂ්යී පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

7.3.2.5 වෙනත් :

i අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ii පත්වීම ස්ථිර කර තිබීම.
iii අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයදුම්කරුවන් පමණි.
iv පූර්වාසන්න වසර පහ (05) තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.
v තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 සිට 7.3.3 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස: අදාළ නොවේ

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත හා වෘත්තීය පරීක්ෂණය යන දෙකින්ම ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලබයි.

7.3.4.1 ලිඛිත විභාගය - (ඇමුණුම-02)

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| යාන්ත්‍රික දැනුම හා මාර්ග නීති | 100 | 50% |

7.3.4.1.1 පවත්වන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල් හෝ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය - (ඇමුණුම-03)

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| කාර්මික දැනුම | 100 | 50% |

7.3.4.2.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීමක් පමණක් සිදු කෙරේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු: බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - අදාල නොවේ

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: ප්‍රසිද්ධ දැන්වීමක් මගින් හෝ අභ්‍යන්තර නිවේදනයක් මගින් හා වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම: - අදාළ නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | 111 ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන(03)ක් ගතවීමට | නිපුණතා පිළිබඳ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි. |

| | | |
|---|---|---|
| | පෙර | (ඇමුණුම - 04) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | 11 ශ්‍රේණියට උසස් වී වසර තුන(03)ක් ගතවීමට පෙර | නිපුණතා පිළිබඳ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි. (ඇමුණුම - 05) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | 1 ශ්‍රේණියට උසස් වී වසර පහ(05)ක් ගත වීමට පෙර | නිපුණතා පිළිබඳ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකි. (ඇමුණුම - 06) |

**8.2** කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

**8.3** කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :
දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් බලය පවරන ලද ආයතනයක් මගින්

## 09. භාෂා ප්‍රවීණතාව

**9.1**

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බඳවා ගනු ලබන නිලධරයන් අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතුය |

## 10. ශ්‍රේණි උසස් කිරීම්

### 10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

#### 10.1.1 සාමාන්‍ය කාර්යය සාධනය අනුව

**10.1.1.1** සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. සේවා ගණයේ 111 ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක්(10) උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.
vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

**10.1.1.2** උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් 11 ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම්

බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

### 10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

#### 10.2.1 සාමාන්‍ය කාර්යය සාධනය අනුව

##### 10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ 11 ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක්(10)ක් උපයාගෙන තිබීම
ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ තිබීම.
iii. අනුමත කාර්යයසාධන ඇගයීම් පරිපාටිය අනුව <u>උසස් කිරීමේ</u> දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

##### 10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 වන ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

### 11. තනතුරුවලට පත්කිරීම – අදාළ නොවේ

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි: විවෘත බඳවා ගැනීමේදී බඳවා ගනු ලබන දින සිට මාස නවයක(09) පුහුණු කාලයකට යටත් කරනු ලබන අතර සීමිත බඳවා ගැනීමේදී බඳවා ගනු ලබන දින සිට මාස තුනක(03) පුහුණු කාලයකට යටත් කරනු ලැබේ. එම පුහුණු කාලය අවසානයේ අදාළ නිලධාරියා නිසි පරිදි පුහුණුව ලබා තිබේද යන්න පරීක්ෂා කරනු ලැබේ. නිසි පරිදි පුහුණුව ලබා ඇත්නම් එම නිලධාරියාව දුම්රිය ධාවන කාර්යය සඳහා යොදවනු ලබන අතර තවදුරටත් පුහුණුව අවශ්‍ය වන්නේ නම් දුම්රිය ධාවන කාර්යයට යෙදවීමට පෙර එම නිලධාරියා වෙත තවදුරටත් පුහුණුව ලබාදෙනු ලැබේ.

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන :

<u>සක්‍රිය සේවා කාලය</u> - සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14.** **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : ඇමුණුම 07**

**15.** **සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.**

**16.** **මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

**17.** **අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.**

**සකස් කළේ : අත්සන : ..................................** **පරීක්ෂා කෙළේ : ..................................**
**(විෂය භාර මාණ්ඩලික නිලධරයා)**

**නිර්දේශ කර ඉදිරිපත් කරමි.**

**අත්සන**
**:....................................**

**(දෙපාර්තමේන්තු ප්‍රධාන)**

**නම**
**:........................................**

**තනතුර**
**:........................................**

**දිනය : ............................**

**නිල මුද්‍රාව**
**:........................................**

**යොමු අංකය :**
**........................................**

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයට අයත් දුම්රිය එන්ජින් රියැදුරු සහායක තනතුර සඳහා සංශෝධනය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.**

**අත්සන**
**:........................................**

**නම**
**:........................................**

**ලේකම්**
**ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය**

දිනය: ............................ නිල මුද්‍රාව :
........................................

යොමු අංකය :
........................................

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙහි දුම්රිය එන්ජින් රියදුරු සහායක තනතුර සඳහා වන මෙම සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය 2016.09.29 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන
:..........................................

නම :
..........................................

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: ............................ නිල මුද්‍රාව
:..........................................

**01.** විභාගයේ /වෘත්තීය පරීක්ෂණයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණයට අයත් දුම්රිය එන්ජින් රියැදුරු සහායක තනතුරෙහි **111** ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය

**02.** විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

ලිඛිත පරීක්ෂණය(සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පමණක් පැවැත්වේ.)

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්මික දැනුම | පැය 02 | 100 | **50%** |

**03.** පවත්වනු ලබන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් හෝ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

**04.**පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යනවග: පුරප්පාඩු ඇති වන පරිදි අවම වශයෙන් වසරකට වරක්

**05.**විභාගය සඳහා වන විෂය නිර්දේශය:

ලිඛිත පරීක්ෂණය:

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්මික දැනුම | දුම්රිය රියදුරු සහායක තනතුරෙහි කාර්යභාරයට සමාන්තර වන සේ යන්ත්‍රෝපකරණ හා ඒවායේ භාවිතයන් පිළිබඳව සරල දැනුම පරීක්ෂා කෙරේ. |

අත්සන..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ................................................

තනතුර ................................................

දිනය ................................................

නිල මුද්‍රාව ................................................

ඇමුණුම - 02

**01.** විභාගයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයට අයත් දුම්රිය එන්ජින් රියැදුරු සහායක තනතුරෙහි 111 ශ්‍රේණියට සීමිත බඳවා ගැනීම සඳහා වන ලිඛිත තරඟ විභාගය

**02.** විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : (සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පමණක් පැවැත්වේ.)

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| යාන්ත්‍රික දැනුම හා මාර්ග නීති | පැය 02 | 100 | **50%** |

**03.** පවත්වනු ලබන බලධරයා: විභාග කොමසාරිස් ජනරාල් වරයා හෝ දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

**04.** පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: පුරප්පාඩු ඇති වන පරිදි අවම වශයෙන් වසරකට වරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| යාන්ත්‍රික දැනුම හා මාර්ග නීති | දුම්රිය එන්ජින්,ගැල් ,මැදිරි වල විවිධ වෙනස්කම් පිළිබඳ මූලික දැනුම , ඉන්ධන හා ලිහිසි තෙල් භාවිතය පිළිබඳ මූලික දැනුම හා ධාවන මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

අත්සන.................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ................................................

තනතුර ................................................

දිනය ................................................

නිල මුද්‍රාව............................................

ඇමුණුම - 03

**01.** වෘත්තීය පරීක්ෂණයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය 3 සේවා ගණයට අයත් දුම්රිය එන්ජින් රියැදුරු සහායක තනතුරෙහි 111 ශ්‍රේණියට සීමිත බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය

**02.** විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්මික දැනුම | පැය 02 | 100 | 50% |

**03.** පවත්වනු ලබන බලධරයා: දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්

**04.** පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: පුරප්පාඩු ඇති වන පරිදි අවම වශයෙන් වසරකට වරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| කාර්මික දැනුම | දුම්රිය රියදුරු සහායක තනතුරෙහි කාර්යභාරයට අදාළව දුම්රිය එන්ජිම ,මැදිරි ,ගැල් හා සංඥා වර්ග පිළිබඳව මූලික දැනුම පරීක්ෂා කෙරේ. |

අත්සන.................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ...............................................

තනතුර ...............................................

දිනය ...............................................

නිල මුද්‍රාව...........................................

ඇමුණුම - 04

**01.** විභාගයේ /වෘත්තීය පරීක්ෂණයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3සේවා ගණයට අයත් දුම්රිය එන්ජින් රියැදුරු සහායක තනතුරෙහි 111 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**02.** විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්මික දැනුම | පැය 02 | ලකුණු 100 | 40% |

**03.** පවත්වනු ලබන බලධරයා: දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් බලය පවරන ලද බලධරයන් විසින්

**04.** පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යනවග: වසරකට දෙවරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්මික දැනුම | දුම්රිය එන්ජින් වර්ග හා ඒවායේ යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය ,දුම්රිය ගැල් හා මැදිරි වල ක්‍රියාකාරිත්වය පිළිබඳව තනතුරට අදාළව දැනුම පරීක්ෂා කිරීම |

අත්සන..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ...............................................

තනතුර ...............................................

දිනය ...............................................

නිල මුද්‍රාව............................................

ඇමුණුම-05

**01.** විභාගයේ /වෘත්තීය පරීක්ෂණයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයට අයත් දුම්රිය එන්ජින් රියැදුරු සහායක තනතුරෙහි 11 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**02.** විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| යාන්ත්‍රික දැනුම හා මාර්ග නීති | පැය 02 | ලකුණු 100 | 40% |
| අවබෝධය | පැය 02 | ලකුණු 100 | 40% |

**03.** පවත්වනු ලබන බලධරයා: දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් බලය පවරන ලද බලධරයන් විසින්

**04.** පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යනවග: වසරකට දෙවරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| යාන්ත්‍රික දැනුම හා මාර්ග නීති | දුම්රිය එන්ජින් ,ගැල්,මැදිරි එකිනෙක සම්බන්ධ කිරීම එකිනෙකින් වෙන් කිරීම හා ඒවායේ විවිධ වෙනස්කම් ,ඉන්ධන හා ලිහිසි තෙල් භාවිතය ධාවන මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |
| අවබෝධය | තම තනතුරට අදාළව දෙනු ලබන උපදෙස් සටහන් කරගැනීම ,අත්පොත් සතිපතා නිවේදන ආදියෙහි අඩංගු කරුණු කියවා තේරුම් ගැනීමේ හැකියාව ,දිග පළල , පරිමාව ,බර ආදී සරළ මිනුම් පිළිබඳ දැනුම ,එන්ජින් වල ක්‍රියාකාරිත්වය හා ප්‍රධාන උපාංග හඳුනා ගැනීම පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම . |

අත්සන...............................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ...............................................

තනතුර ...............................................

දිනය ...............................................

නිල මුද්‍රාව...........................................

ඇමුණුම - 06

01. විභාගයේ /වෘත්තීය පරීක්ෂණයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3සේවා ගණයට අයත් දුම්රිය එන්ජින් රියැදුරු සහායක තනතුරෙහි 1 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| තාක්ෂණික අවබෝධය | පැය 02 | ලකුණු 100 | 40% |
| යාන්ත්‍රික දැනුම | පැය 02 | ලකුණු 100 | 40% |

03. පවත්වනු ලබන බලධරයා: දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් බලය පවරන ලද බලධරයන් විසින්

04.පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: වසරකට දෙවරක්

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| තාක්ෂණික අවබෝධය | දුම්රිය එන්ජින්,ගැල් මැදිරි ක්‍රියාකාරිත්වයේ මෙන්ම දුම්රිය ධාවනයේදී ඇතිවන දෝෂයන් සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය මගින් නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව පිළිබඳව හා ඒ ආශ්‍රිත දැනුම පරීක්ෂා කෙරේ. |
| යාන්ත්‍රික දැනුම | දුම්රිය මාර්ග නීති, එන්ජින් වල යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය හා නඩත්තු කිරීම, දුම්රිය මැදිරි හා ගැල් වල යාන්ත්‍රික ක්‍රියා කාරිත්වය, මිනුම් හි පරිමාවන් පිළිබඳ දැනුම හා ඊට අදාළ වන්නා වූ හා දුම්රියක් ධාවනය කිරීම සම්බන්ධ දැනුම පරීක්ෂා කිරීම. |

අත්සන..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ................................................

තනතුර ................................................

දිනය ................................................

නිල මුද්‍රාව...........................................

ඇමුණුම - **07**

<u>ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය</u>

**මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබාදී ඇති MT -01-2006- A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

**සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය.එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.**

(i) MT-01-III ශ්‍රේණිය

**(අ) MT-01-2006-A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු දහය(10) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්**

**(ආ) MT-01-2006-A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද, II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්**

**MT-01-III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

(ii) MT-01-II ශ්‍රේණිය

**(අ) ඉහත සඳහන් පරිදි MT-01-2006-A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු දහය(10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එහෙත් අවුරුදු විස්ස (20)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති, එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්**

**(ආ) MT-01-2006-A වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්**

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු දහය(10) ක් සම්පූර්ණ වුවද නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්

MT-01-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii) MT-01-I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු විස්ස(20) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක විස්ස(20) ක් හා නව බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය(10) කට නොඅඩු එහෙත් අවුරුදු විස්ස(20) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්

(ඇ) MT-01-2006-A වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබාදී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන නිලධාරීන්

MT-01-I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

අත්සන..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම ..............................................

තනතුර ..............................................

දිනය ..............................................

නිල මුද්‍රාව............................................